# මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය

## (2018 අප්‍රේල් මස 01 දින සිට 2018 ජුනි 30 දක්වා)

### 1. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සංශෝධනය - 2018

පළාත් විසින් කරන ලද ඉල්ලීම් මත පදනම්ව, 2018 වාර්ෂික සංවර්ධන සැලසුම්වල පුළුල් ක්‍රියාකාරකම් පරාසය දක්වා වන සංශෝධන සඳහා මූලික එකඟතාවය ලබාදෙන ලදී.

### 2. පළාත් වෙතින් 2019 වර්ෂය සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන අවශ්‍යතා ලැබීම

2019 වර්ෂය සඳහා වන ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතා සියලුම පළාත්වලින් මුදල් කොමිෂන් සභාව වෙත ලැබී ඇත. පළාත් අවශ්‍යතා පිළිබඳ සමාලෝචන රැස්වීම් අදාල පළාත් බලධාරීන්ගේ සහභාගිත්වයෙන් තුන්වන කාර්තුවේ දී පැවැත්වීමට නියමිත වේ.

### 3. උපායමාර්ගික සැලැස්ම සමාලෝචනය කිරීම / ක්‍රියාත්මක කිරීම

මුදල් කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්ම සමාලෝචනය කර යාවත්කාලීන කරමින් පවතී.

### 4. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2017

2017 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉංග්‍රීසි බසින් සකස් කර ඇති අතර, එය සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තන කටයුතු සිදුකෙරෙමින් පවතී. එය ජනාධිපති ලේකම් කාර්යාලය වෙත කෙටි කාලයක් තුළ ඉදිරිපත් කරනු ලැබේ.

### 5. පළාත් විගණන වාර්තා සමාලෝචනය කිරීම

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද උතුරු පළාත් විගණන වාර්තාව සමාලෝචනය කරන ලද අතර, අපගේ නිරීක්ෂණ විගණකාධිපති වෙත ද පිටපත් සහිතව ගරු පළාත් ආණ්ඩුකාර සහ ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇත.

### 6. මුදල් කොමිෂන් සභාව සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම



මුදල් කොමිෂන් සභාවේ කාර්යාල සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. මුදල් කොමිෂන් සභාවේ දී ප්‍රගති සමාලෝචන රැස්වීම් තුනක් පවත්වන ලද අතර, ඊට අමතරව ව්‍යාපෘති උපදේශන ඒකකය (වාස්තු විද්‍යා පීඨය - මොරටුව විශ්ව විද්‍යාලය) සහ කොන්ත්‍රාත්කරුගේ සහභාගිත්වයෙන් තාක්ෂණික කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදී. 2018 වර්ෂය සඳහා වෙන් කර ඇති රු.මි 180 ක මුදලින් දෙවන කාර්තුව අවසාන වන විට කොන්ත්‍රාත්කරුට රු.මි. 139.26 ක් ගෙවා ඇත. ව්‍යාපෘතියෙහි වැඩසටහන අනුව දින 95 ක ප්‍රමාදයක් ඇති බව නිරීක්ෂණය වේ. 2018 අගෝස්තු මස 31 දින වන විට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නියමිත වේ.

## 7. මුදල් කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය

මුදල් කොමිෂන් සභාවේ භාවිතය සඳහා දත්ත පද්ධතියක් / කළමනාකරණ තොරතුරු පද්ධතියක් සකස් කිරීම සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව සහ ආසියානු පදනම (TAF) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. ඒ අනුව, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) සහ ආසියානු පදනම සමග රැස්වීම් වාර ගණනාවක් පවත්වා ඇති අතර, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) සමග මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළහොත් කාලය සහ පිරිවැය ඉහළ මට්ටමක පවතින බවට මුදල් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කිරීම නිසා ව්‍යාපෘතිය සඳහා විකල්ප මෘදුකාංග සංවර්ධකයෙකු තෝරා ගැනීමට ආසියානු පදනම දැනුවත් කරන ලදී.

## 8. මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත

මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත 2016 වර්ෂයේ දී සකස් කර අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, මෙම කාර්ය නීති කෙටුම්පත් සම්පාදකවරයා වෙත පැවරීමට අතිගරු ජනාධිපතිතුමා විසින් 2018 ජනවාරි මස 02 දින කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ජූනි මස 26 වන දින නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් මූලික පනත් කෙටුම්පත මුදල් කොමිෂන් සභාවේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කර ඇත. මුදල් කොමිෂන් සභාව විසින් පනත් කෙටුම්පත අධ්‍යයනය කිරීමෙන් අනතුරුව නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

## 9. මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් හා පළාත් ප්‍රධාන ලේකම්වරුන් සමග සාකච්ඡාව



2018 අප්‍රේල් මස 10 වන දින පළාත් නවයෙහි ප්‍රධාන ලේකම්වරුන් සමග විශේෂ සාකච්ඡාවක් මුදල් කොමිෂන් සභාවේදී පවත්වන ලදී. මෙම සාකච්ඡාවේ ප්‍රධාන අරමුණ වූයේ සංවර්ධන හා පරිපාලන ගැටළුවල දී පළාත් සභා විසින් මුහුණ දුන් ප්‍රතිපත්තිමය ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමයි. මෙම සාකච්ඡාවේ දී ඔවුන්ගේ වාර්ෂික සංවර්ධන ක්‍රියාදාමයේ ගැටළු ගණනාවක් අවධාරණය කරන ලදී.

## 10. මුදල් කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති නිර්දේශ පිළිබඳ සාකච්ඡාව - 2018

මුදල් කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි ජනාධිපති ලේකම් විසින් මුදල් කොමිෂන් සභාවේ 2018 වර්ෂයේ නිර්දේශ පිළිබඳ සාකච්ඡාවක් 2018 මැයි මස 23 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී. මෙම රැස්වීම සඳහා මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ නිලධාරීන්, ප්‍රධාන ලේකම්වරුන් සහ අනෙකුත් අදාල රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන් සහභාගීවන ලදී. මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ සාකච්ඡා කිරීමෙන් පසු, ප්‍රධාන ලේකම්වරුන් විසින් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ගැටළු පිළිබඳව ද සාකච්ඡා කරන ලදී.

## 11. පළාත් ආදායම් කොමසාරිස්වරුන් සහ පළාත් ප්‍රවාහන අංශයේ නිලධාරීන් සමග රැස්වීම්

2018 අප්‍රේල් මස 02 වන දින පළාත් ප්‍රවාහන අංශයේ නිලධාරීන් සමග සහ පළාත් ආදායම් කොමසාරිස්වරුන් සමග රැස්වීම් දෙකක් මුදල් කොමිෂන් සභාවේ දී පැවැත්විණි. මෙම රැස්වීම් දෙකෙහි අරමුණ වූයේ එම නියෝජිතවරුන්ට පළාත් ප්‍රවාහන හා ආදායම් අංශයේ පවතින ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට අවස්ථාව සලසා දීමයි.





## 12. මුදල් කොමිෂන් සභාවේ මෙහෙයුම් කාර්ය සංග්‍රහය

මුදල් කොමිෂන් සභාවේ මෙහෙයුම් කාර්ය සංග්‍රහය සකස් වෙමින් පවතී. මූල්‍ය කළමනාකරණය සඳහා පද්ධති හා ක්‍රියාපටිපාටි, අවශ්‍යතා තක්සේරු ක්‍රියාපටිපාටි සහ මුදල් කොමිෂන් සභා කාර්යාලයේ පොදු පරිපාලන ක්‍රියාපටිපාටි ලෙස ප්‍රධාන අංශ තුනකින් මෙම කාර්යය සංග්‍රහය සමන්විත වේ. මෙයට අමතරව මුදල් කොමිෂන් සභාවේ කාර්යයන් සරල කිරීම සඳහා වෙනම අභ්‍යන්තර ප්‍රතිපත්ති කාර්ය සංග්‍රහයක් සකස් වෙමින් පවතී.

## 13. කළුතර දිස්ත්‍රික් ක්ෂේත්‍ර චාරිකාව කණේවෙල ඇළ මාර්ගය සහ කෘෂිකාර්මික ව්‍යාපෘති (යහපත් කෘෂිකාර්මික පුරුදු (GAP) 2018.05.10)



මුදල් කොමිෂන් සභාවේ හා බස්නාහිර පළාත් නිලධාරීන් කණේවෙල ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ විවිධ කෘෂිකාර්මික ව්‍යාපෘතිවල (යහපත් කෘෂිකාර්මික පුරුදු (GAP)) ප්‍රගති සමාලෝචනය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත විය. මෙම චාරිකාවේ දී විවිධ ගැටළු හඳුනාගත හැකි විය. මෙම ගැටළු සාකච්ඡා කිරීම සඳහා අදාල වගකිව යුතු පාර්ශව සමග විශේෂ රැස්වීමක් 2018.06.25 වන දින පැවැත්විණි. මෙම රැස්වීම සඳහා බස්නාහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්, කෘෂිකර්ම හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරු සහ බස්නාහිර පළාතේ අනෙකුත් වගකිව යුතු නිලධාරීන් සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ නියෝජිතයෙකු සහභාගි විය.




**කණේවෙල අමුණ ප්‍රතිසංස්කරණය කිරීම**




**යහපත් කෘෂිකාර්මික පුරුදු යටතේ කෘෂිකාර්මික ව්‍යාපෘතින්**

## 14. කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

**පුහුණුව**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පරිගණක රියදුරුබලපත්‍රය සහ PAYE සහ රඳවුම් බදු පිළිබඳව දේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගි විය.

**ආරාධිත දේශන**

"රියදුරන් සඳහා ආචාරධර්ම හා ගුණාංග සහ මාර්ග ආරක්ෂාව පිළිබඳව දැනුවත් වීම" පිළිබඳ දේශනයක් මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි මෝටර් රථ පරීක්ෂක, සී.කේ.එදිරිමුණි මහතා විසින් පවත්වන ලදී.

**කාර්ය මණ්ඩල අධ්‍යයනයන්**

**කාර්තුව ඇතුළත මුදල් කොමිෂන් සභාව මගින් විශේෂ අධ්‍යයනයන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.**

| නම | | මාතෘකාව |
|---|---|---|
| • එරන්දි ගුණසේකර මහත්මිය<br>සහකාර අධ්‍යක්ෂ | - | නීල හරිත ආර්ථිකය |
| • තිසර කසුන් පුෂ්පසිරි මහතා<br>තොරතුරු තාක්ෂණ නිලධාරි | - | ආදායම් පුරෝකතනය |
| • පී.ඉන්ද්‍රාදේවි මහත්මිය<br>සහකාර පර්යේෂණ නිලධාරි | - | පළාත් පුනරාවර්තන අවශ්‍යතා ඇගයීම |
| • පී.ඩී.සී.නිරෝෂි මහත්මිය<br>සංවර්ධන නිලධාරි | - | ග්‍රාමීය සංවර්ධනය |

## 15. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව

මුදල් කොමිෂන් සභාවේ 2017 ජනවාරි 01 වන දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා වූ කාලයට අදාල කාර්යසාධන වාර්තාව 2018 මැයි 22 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එමෙන්ම, 2018 වර්ෂයෙහි පළමු කාර්තුවෙහි කාර්යසාධන වාර්තාව ව්‍යවස්ථාදායක සභාව වෙත 2018 අප්‍රේල් මස 27 වන දින ඉදිරිපත් කරන ලදී.

## 16. කාර්යමණ්ඩලයේ නව බඳවාගැනීම් සහ ස්ථාන මාරු

නව පත්වීම් ලද රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් හතර දෙනෙකු සේවයට පැමිණි අතර, එක් රියදුරෙකු ස්ථාන මාරුවීමක් ලබා වෙනත් ආයතනයකට ගොස් ඇත.

## 17. අභ්‍යන්තර විගණන කමිටුව

කළමනාකරණ දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂකගේ සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරිවරයාගේ සහභාගිත්වයෙන් අභ්‍යන්තර විගණන කමිටුවේ දෙවන කාර්තුවේ රැස්වීම 2018 ජුනි 12 වන දින පැවැත්විණි. මෙම රැස්වීමේ දී ගනු ලැබූ තීරණයන්, අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය වෙත දන්වන ලදී. අභ්‍යන්තර විගණනය, නීතිමය රාමුවට අමතරව කාර්යසාධන රාමුවට ද අනුකූල විය යුතු බව මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

## 18. ජාතික හා පළාත් මට්ටමේ මනා සම්බන්ධීකරණය තුළින් සංවර්ධන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ වැඩමුළුව පිළිබඳ පසුවිපරම් කිරීම

2015 වර්ෂයේ සිට ජනාධිපති ලේකම් කාර්යාලය සමග සහයෝගීත්වයෙන් ඉහත විෂය සම්බන්ධයෙන් සාකච්ඡා මාලාවක් පවත්වා ඇත. මුදල් කොමිෂන් සභාව විසින් අදාල රේඛීය ආයතන විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය සමාලෝචනය කර ඇත. පසුව මේ පිළිබඳව අදාල ආයතන

වෙත ලිපියක් යවා ඇති අතර, 2018 දෙවන කාර්තුවේ දී ප්‍රගති වාර්තා ලබාගැනීම සහ අධ්‍යයනය කිරීමද සිදු කරන ලදී.

## 19. වෛද්‍ය නිලධාරීන් මුදල් කොමිෂන් සභාව වෙත පැමිණීම



මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය හා කාර්යයන් අධ්‍යයනය කිරීම සඳහා වෛද්‍ය පරිපාලනය ක්ෂේත්‍රයේ වෛද්‍යවරුන් මුදල් කොමිෂන් සභාව වෙත පැමිණෙන ලදී. නිර්දේශ ක්‍රියාපටිපාටිය, පළාත් සඳහා සැලසුම්කරණය හා අයවැය පටිපාටිය, පළාත් සඳහා ප්‍රතිපාදන සැපයීම, පළාත්වල ආදායම් මූලාශ්‍ර, පළාත් පාලන ආයතන සඳහා මූල්‍යකරණය, පළාත් කාර්යමණ්ඩලය යනාදිය සම්බන්ධයෙන් එම නිලධාරීන් වෙත කරන ලද ඉදිරිපත් කිරීමේ ඇතුළත් විය.

## 20. රැස්වීම්, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා සහභාගීත්වය / පැමිණීම

මුදල් කොමිෂන් සභාවේ සභාපතිතුමා, ලේකම්තුමා සහ ඇතැම් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පහත සඳහන් රැස්වීම් හා වැඩමුළුවලට සහභාගී වූහ.

- ශ්‍රී ලංකාවේ නගරවල තත්ත්වය
- දේශීය සංවර්ධන සහයෝගී ව්‍යාපෘති
- ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ අංශය
- තිරසාර සංවර්ධන අරමුණු
- පළාත් පාලන ආයතන සඳහා සේවක සංඛ්‍යා අනුමැතිය
- අන්තර් පළාත් සම්බන්ධීකරණ කමිටු රැස්වීම
- ප්‍රවාහන සබඳතා කළමනාකරණ ව්‍යාපෘති
- මූල්‍ය නියාමන පනත් කෙටුම්පත
- බෝ නොවන රෝග සඳහා පළමු වාර්ෂික සාර්ක් (SAARC) සමුළුව
- ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යවසාය අංශයේ තත්ත්වය

## 21. කොමිෂන් සභාවේ රැස්වීම්

- කාර්තුව තුළ දී මුදල් කොමිෂන් සභා රැස්වීම් පහත පරිදි පැවැත්විණි.
  - 2018 අප්‍රේල් 25
  - 2018 මැයි 12
  - 2018 ජූනි 09
- සෑම කොමිෂන් සභා රැස්වීමකටම පෙර කොමිෂන් සභාවේ උප කමිටුව රැස්වන ලදී.
- විධායක නිලධාරීන්ගේ රැස්වීම් - විධායක නිලධාරීන්ගේ රැස්වීම් සතිපතා අඛණ්ඩව පවත්වන ලදී.
- කාර්ය මණ්ඩල රැස්වීම් - 2018.04.05, 2018.05.31 සහ 2018.06.29 දිනවල රැස්වීම් තුනක් පවත්වන ලදී.